# ඇබෑර්තු

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## වාරිමාර්ග අමාත්‍යාංශය

ලෝක බැංකුව අරමුදල් සපයනු ලබන ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) සඳහා, අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛය හා රජයේ බඳවා ගැනීම් ක්‍රියාපටිපාටිය ප්‍රකාරව පහත සඳහන් තනතුරු පිරවීම සඳහා, "කොන්ත්‍රාත් පදනමින්" ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් හා කැපවූ ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අදාළ වැටුප් පිළිබඳ විස්තර, අංක 01/2019 දරන 2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය (MSD) හි වගුව 3හි තීරුව 03 හි සඳහන්ව ඇත.

අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය, රජයේ රෙගුලාසි පිළිබඳ හුරුපුරුදුතාවය හා පරිගණක සාක්ෂරතාවය පූර්වාවශ්‍යතාවයන් වේ. විදේශ අරමුදල් යෙදවූ ශ්‍රී ලංකාවේ සිදුකළ ව්‍යාපෘතිවල සේවය කිරීමේ පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමක් වේ.

| අංකය | PS වර්ගීකරණය | තනතුරු නාමය | තනතුරු ගණන | අදාළ වන චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS1 | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | අංක 1/2019 දරන චක්‍රලේඛය |
| 02 | PS2 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | |
| 03 | PS3 | පරිසර විශේෂඥ | 01 | |
| 04 | PS3 | භූ තොරතුරු විශේෂඥ | 01 | |
| 05 | PS3 | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් සම්පාදන නිලධාරී (සමාජ ආරක්ෂණ) | 01 | |
| 06 | PS3 | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති විශේෂඥ (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්) | 01 | |
| 07 | PS3 | මූල්‍ය කළමනාකරු | 01 | |
| 08 | PS4-A | අභ්‍යන්තර විගණක | 01 | |
| 09 | PS4-A | ඉංජිනේරු – සිවිල් (කොන්ත්‍රාත් කළමනාකරණ) | 01 | |
| 10 | PS4-A | ඉංජිනේරු (ප්‍රසම්පාදන) | 01 | |
| 11 | PS4-B | ඉංජිනේරු (සිවිල්, යාන්ත්‍රික, විදුලි) | 04 | |
| 12 | PS4-B | සන්නිවේදන නිලධාරී | 01 | |
| 13 | PS5 | ජල කාලගුණ විද්‍යා තාක්ෂණ විද්‍යාඥ | 01 | |
| 14 | PS5 | ඉංජිනේරු සහකාර (සිවිල්) | 01 | |
| 15 | PS5 | සමාජ නිලධාරී | 01 | |
| 16 | PS5 | පරිසර නිලධාරී | 01 | |
| 17 | PS5 | ගිණුම් නිලධාරී | 01 | |
| 18 | PS6 | සංවර්ධන නිලධාරී | 01 | |
| 19 | PS6 | පරිපාලන නිලධාරී | 01 | |
| 20 | | කළමනාකරණ සහකාර (තාක්ෂණ) | 02 | 06-2006 රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 21 | | කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) | 02 | |

අවශ්‍ය වැඩිදුර තොරතුරු සඳහා අපගේ වෙබ් අඩවිය වන www.iwwrmp.lk/vacancy වෙත යොමුවන්න.

(කරුණාකර, ඉහත සඳහන් චක්‍රලේඛයට යොමුවීමට මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවිය වෙත යොමුවන්න)

එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් වූ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත, 2021 ජූලි 15 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP),**
**02 වන මහල, මහවැලි කේන්ද්‍රය,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**

කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ඇත. මේ සම්බන්ධයෙන් යම් බලපෑම් සිදු කිරීම නුසුදුස්සකු බවට තීරණය කිරීමට හේතුවනු ඇති අතර, එවන් අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

**ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය,**
**දිනය : 2021.07.01**